රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
அரச கணக்குகள் திணைக்களம்
Department of State Accounts

මගේ අංකය / எனது இல. / My No. SA/IC/1/3-i
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2014. 12. 29

රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක : 240 /2014

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
දිස්ත්‍රික් ලේකම් වරුන් වෙත

# 2015 වසර තුලදී රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත මාසික ගිණුම් සාරාංශ මගින් ගිණුම් දත්ත සම්ප්‍රේෂණය කිරීම

අමුණා ඇති උපලේඛණයේ සඳහන් කර ඇති පරිදි සියළුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් 2015 වසර තුලදී, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත මාසික ගිණුම් සාරාංශ ඉදිරිපත් කිරීම සඳහා නියමිත දින පසුපිටෙහි දක්වා ඇත.

2. රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් කිසියම් මාසයක් සඳහා වූ මාසික ඒකාබද්ධ ගිණුම් ප්‍රකාශන ඒ හා පසුව යෙදෙන මාසයේ 12 වන දිනට පෙර පිළියෙල කරනු ලැබේ. එබැවින් නියමිත දිනට පෙර මෙම දෙපාර්තමේන්තුව වෙත ලැබෙන පරිදි මාසික ගිණුම් සාරාංශය විද්‍යුත් තැපැල මගින් පමණක් එවීමට කටයුතු කල යුතුවේ. සාවද්‍ය තොරතුරු භාණ්ඩාගාර ගිණුම්වලට ඇතුලත් වීම වළක්වා ගනු සඳහා CIGAS වැඩසටහනට එදිනෙදා ඇතුලත් කරන තොරතුරු දිනපතා පරික්ෂාකර නිවැරදි තොරතුරු එවීමට වග බලා ගත යුතුය. මෙලෙස ඉදිරිපත් කරනු ලබන ගිණුම් සාරාංශය ප්‍රධාන ගණකාධිකාරී / ගණකාධිකාරී විසින් **පරික්ෂා කිරීමෙන් පසුව ප්‍රධාන ගණකාධිකාරී / ගණකාධිකාරීගේ විද්‍යුත් ලිපිනය හරහා පමණක්** විද්‍යුත් තැපැල මගින් එවීමට කටයුතු කල යුතු වේ.

3. එමෙන්ම යම් දත්ත ප්‍රතික්ෂේප කිරීමක් වෙතොත් ඒ සම්බන්ධයෙන් විද්‍යුත් තැපැල හරහා ඔබ වෙත දැනුම් දෙනු ලබන අතර, සිදු කරනු ලබන අවශ්‍ය නිවැරදි කිරීම් නියමිත දිනට පෙර එවිය යුතුවේ.

4. ප්‍රමාද වන මාසික ගිණුම් සාරාංශ සම්බන්ධයෙන් මු.රෙ. 426 අනුව කටයුතු කරන බව අවධාරනය කෙරේ.

(Signed)

ඩී. එම්. ඒ. හරස්ගම
රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්
භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වෙනුවට

පිටපත : විගණකාධිපති

<u>භාණ්ඩාගාරයට මාසික ගිණුම් දත්ත එවිය යුතු කාල වකවානු</u>

| ගිණුම්කරණ මාසය | විද්‍යුත් තැපැල මගින් භාණ්ඩාගාරයට දත්ත එවීමට ඉඩ දී ඇති අවසාන දිනය | | | |
|---|---|---|---|---|
| | **උපලේඛණ - 1** | | **උපලේඛණ - 11** | |
| ජනවාරි | පෙබරවාරි | 06 | පෙබරවාරි | 10 |
| පෙබරවාරි | මාර්තු | 04 | මාර්තු | 09 |
| මාර්තු | අප්‍රේල් | 06 | අප්‍රේල් | 08 |
| අප්‍රේල් | මැයි | 07 | මැයි | 11 |
| මැයි | ජූනි | 04 | ජූනි | 08 |
| ජූනි | ජූලි | 06 | ජූලි | 08 |
| ජූලි | අගෝස්තු | 05 | අගෝස්තු | 07 |
| අගෝස්තු | සැප්තැම්බර් | 03 | සැප්තැම්බර් | 07 |
| සැප්තැම්බර් | ඔක්තෝබර් | 05 | ඔක්තෝබර් | 07 |
| ඔක්තෝබර් | නොවැම්බර් | 04 | නොවැම්බර් | 06 |
| නොවැම්බර් | දෙසැම්බර් | 03 | දෙසැම්බර් | 07 |
| දෙසැම්බර් | මෙම දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන 2015 මුදල් වර්ෂයේ ගිණුම් පියවීමේ චක්‍රලේඛයේ උපදෙස් පරිදි | | | |